## පුංචි අපි Kids Corner

25.5.2014

### Vesak Day

1. Lord Buddha's birth, enlightenment and death is celebrated on the vesak day, by all buddhist people all over the world.

2. We light oil lamps and lanterns to honour lord buddha. We go to the temple to offer flowers and observe sil.

3. For the first time in my life I observed sil on this vesak day. I learnt a good message on this day. That is to be a good buddhist you must stay away from killing and harming others, stealing, Misbehaving, lying, and taking drugs or alcohol.

4. That is called the Pancha Seelaya, and we must observe it every day and not only on the vesak day.

by Sayaara Malalasekera.
Age 9 years
Grade 4

දහම් පාසල
බෙරික් ශාඛාමූණි සම්බුද්ධ විහාරය
බෙරික්සල

# අපේ රන්තරු ප්‍රසංගය

දෙදහස් දහතුන වසරේ සැප්තැම්බර් 8 වැනි ඉරිදා අපේ රන්තරු ප්‍රසංගය පැවැත්වුණා. එපින් සහ රොක්ස්බර්ග් පාක් සිංහල භාෂා පාසල් දෙකේ සිසු දරුවන් මෙයට සහභාගි වුණා. පැවැත්වුණේ සවුත් මොරැංග් ප්ලෙන්ටි රේන්ජර්ස් ශාලාවෙදියි.

මම රගපෑවේ ''රිදුණු ගුරුසිත'' නාට්‍යයේයි. ඒ රජවාසලේ චාමර සලන්නියක් ලෙසටයි. මගෙ තාත්තා මටයි මගෙ යාලුවා දෙව්මිටයි ලස්සන සෙමර පවන්පත් හැදුවා. අපේ ප්‍රසංගයට ගොඩක් දෙමව්පියෝ හිතවත්තු උදව් කළා. ඒ හැමෝටම අපි ස්තුති කරනවා.

අනෙක් චරිතවලට හිටපු ළමයි ඔක්කෝම ප්‍රියකරු ඇඳුම් පැළඳුම් හා ආභරණ ඇඳලා හිටියා. මේ ලස්සන ඇඳුම් නිර්මාණය කලේ මරිනි වෙත්තසිංහ ගුරුතුමියයි. නාට්‍ය පිටපත ලියන්න මහන්සි වුණේ අපේ විපුලි ගුනසේකර ගුරුතුමියයි. ලිලංගා බාලචන්ද්‍ර ගුරුතුමි කෝරසය කියන අයියල අක්කලව පුහුණු කළා. ඒ වගේම රඟපෑමේ කොටස් හදමින් අපිට ගොඩක් උදව් කළා. ශ්‍රීනාත් මද්දුමගේ මාමාත් අපිට ගොඩක් උපදෙස් දුන්නා. මේ සියලුදෙනාටම අපි ගොඩාක් ණයගැතියි.

මේ ලස්සන නාට්‍යය අපි හොඳට ඉදිරිපත් කළා. පුංචි පංතිවලින් නංගිලා මල්ලිලා හුරුබුහුටි රංගන හා ගීත ඉදිරිපත් කළා. ඒවත් හරි ලස්සනයි. මේ සියලු දේ එකතුවෙලා අපේ ප්‍රසංගය පැවැත්වුණා.

තව අවුරුදු කිහිපයකින් මේ වගේ ලස්සන ප්‍රසංගයක් තියේවි !

**පියාරා වන්නිආරච්චි**
7/8 ශ්‍රේණිය




සන්නස වෙළඳ දැන්වීම් සඳහා විමසන්න
Advertising Enquiries

**S Jayasinghe** 03 8707 4604
0402 025 516
sannasanews@gmail.com

